ROUND TABLE CAMERA CLUB

# Seeing Light - 2018

## පාසල් දරුවන් සඳහා වන ඡායාරූප තරඟය, ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණය

ආලෝකය දැකීම- 2018, Round Table Camera Club මගින් පැවැත්වීමට යෙදෙන, පාසල් දරුවන් වෙනුවෙන්ම කැපවුණු දීප ව්‍යාප්ත තරඟයක් සහ ප්‍රදර්ශනයකි. ඡායාරූප ශිල්පය හරහා දෘශ්‍ය සන්නිවේදනයෙහි විද්‍යාව, ශිල්පය සහ කලාව සමාජගත කිරීමත්, ඒ හරහා ජාතික සහ ජාත්‍යන්තර තලයෙහි තරග වැදිය හැකි කෘතහස්ත ශිල්පීන් බිහිකිරීමට උරදීමත් මෙම ව්‍යායාමයෙහි අරමුණ වේ.

### වයස් කාණ්ඩ

සහභාගී වීමට නියමිත සිසුන් පහත දක්වා ඇති උපදෙස් පරිදි වයස් කාණ්ඩ දෙකෙන් එකක් යටතේ තරඟ වැදීම සිදු කළ යුතු වේ.

1. අට (8) වසර හා ඉහළ ( 2018 වසරේදී 8 වසරේ හෝ ඊට ඉහළ වසරක ඉගෙනුම ලබන)
2. හත (7) වසර හා පහළ (2018 වසරේදී 7 වසරේ හෝ ඊට පහළ වසරක ඉගෙනුම ලබන)

තරඟයට සහභාගී වන ශිෂ්‍යයාගේ උපන් දිනය මෙයට අදාළ නොවේ.

### තරඟ අංශ

තරඟය අංශ 3 (තුනකින්) යුක්ත වේ.

1. මුළුතැන්ගෙයි ක්‍රියාකාරකම්
2. ජලය
3. ගමන් බිමන්

### ත්‍යාග

#### පළමු ස්ථානය

- රන් පදක්කම.
- සහතික පත්‍රය.
- Institute of Multimedia Education විසින් ලබාදීමට නියමිත ශිෂ්‍යත්ව 6ක්.
  8 වසර හා ඊට ඉහළ සිසුන්ට අදාල සිසුවාගේ වයස Introduction to Digital Photography හෝ, Advanced Certificate in Photography යන පාඨමාලා දෙකෙන් එකක් සඳහා යොමුකරණු ලැබේ.
  7 වසර හා ඊට පහළ සිසුන්ට Introduction to Digital Photography පාඨමාලාව
- අනුග්‍රාහක භවතුන් සහ ආයතන විසින් ලබා දෙන රු.15 000.00 ක් වටිනා ත්‍යාග.
- Repertoire - State Literary Festival 2016 හි හොඳම විද්‍යාත්මක ප්‍රකාශනය හා හොඳම සැකසුම ලෙස තේරී පත් වූ වනජීවී ඡායාරූප ග්‍රන්ථය.
- රූපණ සංකල්ප- දෘශ්‍ය සන්නිවේදන නිර්මාණකරණය පිළිබඳ ග්‍රන්ථය.

#### දෙවන ස්ථානය

- රිදී පදක්කම.
- සහතික පත්‍රය.
- අනුග්‍රාහක භවතුන් සහ ආයතන විසින් ලබා දෙන රු.10 000.00 ක් වටිනා ත්‍යාග.
- Repertoire - State Literary Festival 2016 හි හොඳම විද්‍යාත්මක ප්‍රකාශනය හා හොඳම සැකසුම ලෙස තේරී පත් වූ වනජීවී ඡායාරූප ග්‍රන්ථය.
- රූපණ සංකල්ප- දෘශ්‍ය සන්නිවේදන නිර්මාණකරණය පිළිබඳ ග්‍රන්ථය.

## තෙවන ස්ථානය

- ලෝකඩ පදක්කම.
- සහතික පත්‍රය.
- රු.5 000/- ක් වටිනා ත්‍යාග කට්ටලය.
- Repertoire - State Literary Festival 2016 හි හොඳම විද්‍යාත්මක ප්‍රකාශනය හා හොඳම සැකසුම ලෙස තේරී පත් වූ වනජීවී ඡායාරූප ග්‍රන්ථය.
- රූපණ සංකල්ප- දෘශ්‍ය සන්නිවේදන නිර්මාණකරණය පිළිබඳ ග්‍රන්ථය

## තරඟයේ අයිතිය සහ භාරකාරත්වය

තරඟයේ අයිතිය සහ භාරකාරත්වය Round Table Camera Club සතු වේ.

## තරඟ නීති

### තරඟයට සහභාගී වීම

1. ශ්‍රී ලංකාව තුළ පාසල් අධ්‍යාපනය ලබන ඕනෑම ශිෂ්‍යයෙකුට තරඟයට සහභාගී විය හැකිය.
2. එක් ශිෂ්‍යයෙකුට තරඟ වැදිය හැක්කේ එක් ශ්‍රේණි/වසර බාණ්ඩයක් යටතේ පමණි.
3. ශිෂ්‍යයෙකුට තරඟ අංශ තුනම යටතේ තම නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.
4. එක් ශිෂ්‍යයෙකුට එක් තරඟ අංශයකින් ඉදිරිපත් කළ හැකි උපරිම නිර්මාණ සංඛ්‍යාව තුනකි.
5. තරඟය සඳහා ඉදිරිපත් කළ හැක්කේ අදාළ ශිෂ්‍යයා විසින්ම ඡායාරූප ගත කළ නිර්මාණ පමණි.
6. සහභාගී වන ශිෂ්‍යයා ඡායාරූපයේ ප්‍රකාශන හිමිකම දරන්නා විය යුතුය.
7. ඉදිරිපත් කරන ඡායාරූප සියල්ලම ශිෂ්‍යයාගේ පංතිභාර ගුරුවරයා, අයදුම් කරනු ලබන පාසලේ ඡායාරූප සංගමය භාර ගුරුවරයා හෝ විදුහල්පතිවරයා විසින් සහතික කරවා එවිය යුතුය.
8. ත්‍යාග සහ ප්‍රදර්ශනය සඳහා තෝරාගනු ලබන ඡායාරූපවල මුලික ඡායාරූපය (Original file) විනිසුරුවන්ගේ අධීක්ෂණය සඳහා ලබාදිය යුතුය. එසේ ලබානොදෙන සියලුම තරඟකරුවන් තරඟයෙන් සහ ප්‍රදර්ශනයෙන් ඉවත් කෙරෙනු ඇත.
9. සාවද්‍ය හා විනය විරෝධී ක්‍රියා අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දෙනු ලැබේ.
10. Round Table Camera Club හි ජ්‍යෙෂ්ඨ සාමාජිකත්වය දරන ජාතික හා අන්තර්ජාතික මට්ටමේ ඡායාරූප ශිල්පීන්ගෙන් යුතු විනිසුරු මඬුල්ලක් විසින් ජයග්‍රාහකයන් තෝරාගනු ලැබේ.
11. Round Table Camera Club සාමාජිකයින්ගේ සහ අනුග්‍රාහක ආයතන වල හිමිකරුවන්ගේ පවුල් වල සාමාජිකයින්ට මෙම තරගය සඳහා සහභාගී වීමට අවසර නොමත.
12. තරගය සඳහා එවන ඡායාරූපවල වගකීම තරගකරුවන් සතුය. තැපෑලේදී සිදුවියහැකි නැතිවීම් හෝ හානිවීම් වලට Round Table Camera Club විසින් වගකියනු නොලැබේ. දෘඪ කවරකය බහා ලියාපදිංචි තැපෑලෙන් එවීම තුලින් මෙම හානි අවම කරගත හැකිය.
13. තරඟය, ප්‍රදර්ශනය සහ සම්මන්ත්‍රණය සම්බන්ධව Round Table Camera Club සහ විනිශ්චය මණ්ඩලය විසින් ගන්නා සියලු තීරණ අවසන් තීරණ වන අතර ඒ සම්බන්ධව කිසිඳු පිළිතුරු සැපයීමක් හෝ බැඳීමක් Round Table Camera Club සිදු කරන්නේ නැත.
14. ඉදිරිපත් කළ නිර්මාණ වල ගුණාත්මකභාවය පරිසාධන ප්‍රමිතියට වඩා පහළ මට්ටමක පවතී නම් ත්‍යාග ප්‍රදානය නොකර සිටීමේ අයිතිය Round Table Camera Club සතු වේ

## ඡායාරූප සඳහා බලපාන නීති

1. මින් ඉහත පැවති තරඟ ජයග්‍රහණය කරන ලද ඡායාරූප මෙම තරඟය සඳහා ඉදිරිපත් කිරීමට නොහැක.
2. පරිලෝකනය (ස්කෑන්) කරන ලද විනිවිදක (Negatives & Slides) JPEG අකාරයට හරවා ඉදිරිපත් කල යුතුය.
3. ඡායාරූපයේ මුද්‍රිත මුහුණත මත දිය සලකුණු (Watermarks ) සහ වෙනත් හඳුනාගැනීමේ සලකුණු යෙදීමට අවසර නොමැති අතර එවැනි වූ සලකුණු සහිත නිර්මාණ තරඟයෙන් ඉවත් කරනු ලැබේ.
4. සංයුක්ත, එක මත එක අතිපිහිත කරන ලද ඡායාරූප හෝ කැමරාවෙන්ම සිදුකරන ලද ද්විත්ව හෝ බහු අනාවරණ ඡායාරූප තරඟය සඳහා ඉදිරිපත් කිරීමට අවසර නැත.
5. ඡායාරූප ක්‍රොප් කිරීමට (Cropping) අවසර ඇති අතර ඡායාරූප ක්‍රොප් කිරීමේදී මුද්‍රණය කිරීමට අවශ්‍ය අවම ප්‍රමාණයට වඩා අඩු තොරතුරු අඩංගු වන පරිදි කුඩා නො කිරීමට සැලකිලිමත් විය යුතුය.
6. ඡායාරූපයේ අල්ප ලෙස පිරිපහදු කිරීම්, සංවේදකයේ දූහුවිලි අංශු වලින් ඇතිවූ පැල්ලම් ඉවත් කිරීම්, ඩොජ් සහ බර්න් කිරීම්, ඡායාරූපයේ තියුණු භාවය සීරු මාරු කිරීම් හා සමස්ත ඡායාරූපයට සිදු කරන පසු සැකසුම් කිරීමට තරඟ කරුවන්ට අවසර ඇත.
7. සියලුම ඡායාරූප වර්ණ ඡායාරූප විය යුතුය.
8. සියලුම ඡායාරූප මුද්‍රිත මාධ්‍යයෙන් ඉදිරිපත් කළ යුතු අතරඩ එක් පැත්තක උපරිම දිග අඟල් 15 ක් පමණක් විය යුතු අතර වඩාත් දිග පැත්තේ අවම දිග අඟල් 10 අඩු නොවිය යුතුය.
9. පහත තොරතුරු සුදු කඩදාසියක ලියා ඡායාරූපයට හානියක් නොවන පරිදි ප්‍රවේසමෙන් ඡායාරූපයේ අනෙක් පස අලවා එවිය යුතුය.
   - වසර/ශ්‍රේණිය
   - වයස් ඛාණ්ඩය (අට වසර හා ඉහළ හෝ හත වසර හා පහළ)
   - තරඟ අංශය.
   - ඡායාරූපයේ මාතෘකාව.
   - තරඟකරුවාගේ සම්පූර්ණ නම.
   - පාසල.
10. ඡායාරූප පහත සඳහන් ලිපිනයට තැපැල් කර හෝ අතේ ගෙනැවිත් භාරදිය හැකිය. ඡායාරූප තැපැල් කර එවීමේදී හානි නොවන ලෙස එවීමට වගබලා ගත යුතුය.

**Round Table Camera Club**
**C/O Institute of Multimedia Education**
**15C, Kirulapone Avenue,**
**Colombo - 05**
**Tel: (011)3094300**

**Round Table Camera Club**
**C/O Mr G Hettiarachchi**
**No 170, Professor Nandadasa Kodagoda**
**Mawatha Colombo - 07**
**Tel: (011) 269 7025**

11. ප්‍රදර්ශනයට තෝරා ගනු ලැබූ ඡායාරූපවල හිමිකරුවන්ට එම මුද්‍රිත ඡායාරූප අගෝස්තු 19 වනදා ප්‍රදර්ශනයෙන් අනතුරුව හෝ 2018 සැප්තැම්බර් 20 වන දිනට පෙර ඉහත සඳහන් ලිපිනයෙන් නැවත ලබාගත හැකිය. එසේ ලබා නොගන්නා ඡායාරූප මසක කාලයෙන් අනතුරුව (අගෝස්තු 20 - සැප්තැම්බර් 20) විනාශ කර දමනු ලැබේ.
12. ප්‍රදර්ශනයට තෝරා නොගන්නා ඡායාරූප අගෝස්තු 18 වනදා සවස 2:00 සිට සහ අගෝස්තු 19 වනදා උදේ 9:00 සිට ප්‍රදර්ශන ශාලාවේදී Round Table Camera Club සාමාජිකයින්ගෙන් නැවත ලබා ගත හැකිය. එසේ ලබා නොගන්නා, ප්‍රදර්ශනයට තෝරා නොගත් ඡායාරූප ප්‍රදර්ශනයෙන් පසුව විනාශ කර දමනු ලැබේ.

## නිර්මාණ භාරගන්නා අවසන් දිනය

2018 ජූනි 15.

සියලු ඡයාරූප ජූනි 15ට පෙර ඉහත සඳහන් ලිපිනයට හෝ එකතු කිරීමේ මධ්‍යස්ථාන වලට ලැබිය යුතුය.

## ජයග්‍රාහකයින් ප්‍රදර්ශනයට සහභාගී වීම

තරඟයේදී ප්‍රධාන ස්ථාන සහ කුසලතා සහතික ලබන සිසුන් ප්‍රදර්ශන භූමියේ සිටීම මගින් නරඹන්නන් සහ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨයින් අඳුනාගැනීමටත්, ඔවුන්ගෙන් අධ්‍යාපනය ලැබීමටත් එම සිසුන්ට මහඟු අවස්ථාවක් හිමිවන බැවින් එසේ ගැවසෙන ලෙස ප්‍රදර්ශනයට තේරී ඇති ඡායාරූප ඉදිරිපත් කල සිසුන්ට Round Table Camera Club ආරාධනා කර සිටියි.

එසේ සහභාගී වන සෑම සිසුවකු හෝ සිසුවියකු සමගම දෙමාපියන්ගෙන් කෙනෙකු හෝ භාරකරුවකු සිටිය යුතුමය.

## වැඩමුළු සඳහා සහභාගී වීම

Round Table Camera Club මගින් 18 වනදා සවස් වරුවේ සහ 19 වැනි දා දිනය පුරා ජේ.ඩී.ඒ. පෙරේරා කලාභවනේදී වැඩමුළු / අධ්‍යාපන සැසි පැවැත්වීමට සැලසුම් කර ඇත.

තම ඡායාරූපය ප්‍රදර්ශනය සඳහා තේරී ඇති පාසැල් ළමුන්, වැඩමුළු සඳහා සහභාගි වනු ඇතැයි විශේෂයෙන්ම බලාපොරොත්තු වනු ලැබේ.

## කර්තෘ හිමිකම් හා ප්‍රකාශන අයිතිය

තරඟය සඳහා ඉදිරිපත් කරණු ලබන සියලුම ඡායාරූපවල කර්තෘ හිමිකම් හා ප්‍රකාශනයට පත්කිරීමේ තනි අයිතිය සහභාගීවන ශිෂ්‍යයා සතුවිය යුතුය.

ඡායාරූපවල කර්තෘ හිමිකම තරඟකරුවන්ම සතුවන අතර කර්තෘභාවය ඡායාරූප ප්‍රදර්ශනය කරන සෑම විටකදීම ඒ සමග සඳහන් කරනු ඇත.

තරඟයට ඡායාරූප ඉදිරිපත් කිරීම මගින් තරගකරුවකු විසින් තමාගේ ඡායාරූප පහත දැක්වෙන අරමුණු සඳහා භාවිතා කිරීමටත්, ඕනෑම මාධ්‍යයක ප්‍රතිනිර්මාණය කිරීම සඳහාත් Round Table Camera Club ආයතනයට අනන්‍ය නොවූ ආකාරයෙන් බලය පවරනු ලබයි:

- තරඟ විනිශ්චය සඳහා.
- Round Table Camera Club ආයතනය විසින් තෝරා ගන්නා මෙරට හෝ පිටරට ඕනෑම ස්ථානයක ඕනෑම කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා.
- දැනට තීරණය කර ඇති හෝ මින් මතුවට තීරණය කරනු ලබන, Round Table Camera Club හෝ තුන්වන පාර්ශවයන්ට අයිති, ප්‍රදර්ශනයට අදාල සම්බන්ධීකාරක අංග තුල භාවිතය සඳහා.
- තරඟයේ, ප්‍රදර්ශනයේ සහ ත්‍යාග ප්‍රදානෝත්සවයේ ප්‍රවර්ධන කටයුතු උදෙසා.
- Round Table Camera Club ප්‍රකාශන සඳහා

## ආචාරධර්ම

තරඟය සඳහා ඡායාරූප ගැනීමේදි හා අප වෙත එවීමේදී සම්මත ආචාර ධර්ම සීමාවන් තුළ සිට කටයුතු කරන ලෙස අප ඔබට අවවාද කර සිටිමු. Round Table Camera Club විසින් සෑම ඡායාරූපයක් ම වෙන් වෙන්ව පරීක්ෂා කර බලනු ලබන අතර මහජන ප්‍රදර්ශනයට සුදුසු නොවන ඡායාරූප තරඟයෙන් ඉවත් කරනු ලැබේ.